සී/සහිත ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2016 හා 2017 සමාගමේ ඒකාබද්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව සමාගමේ සභාපති වෙත 2018 නොවැම්බර් 13 දින නිකුත් කරන ලදී. විස්තරාත්මක වාර්තාව සමාගමේ සභාපති වෙත 2019 දෙසැම්බර් 26 දින නිකුත් කරන ලදී. සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2019 ජනවාරි 03 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරයි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

1.4 මතය ව්‍යාවනයසඳහා පදනම

--------------------------------

(අ) ලෙජර ගිණුම් පැවතියද ලෙජර ගිණුම්වල සටහන් නොකර භාණ්ඩාගාර ප්‍රදාන, සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු, පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන, ක්ෂය සඳහා ප්‍රතිපාදනවල එකතුව වන රු. 59,370,157 ක් ඍජුවම ශේෂ පිරික්සුමට හා මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර තිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2017 ජනවාරි 01 දිනට දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය පිළිවෙලින් රු. 13,414,281 ක් හා රු. 2,826,317 ක් විය. කෙසේ වෙතත් සමාගම විසින් ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන විධිමත්ව පවත්වා නොගැනීම නිසා එම ශේෂයන්හි නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.

(ඈ) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව, ක්ෂය වෙන්කිරීම සිදුකළ යුත්තේ හීන වන ශේෂ ක්‍රමයට වුවද, ක්ෂය ගණනය කිරීම සරල මාර්ග ක්‍රමය පදනම් කරගෙන සිදුකර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 63 ඡේදය අනුව හානිකරණ අලාභ හඳුනා ගත යුතුය. කෙසේ වෙතත් සමාගම විසින් දේපල පිරියත හා උපකරණ සඳහා හානිකරණ පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 55 ඡේදයට පටහැනිව, පාරිතෝෂිත දීමනා සඳහා බැඳීම වූ රු.10,839,022 ක් සමාගම විසින් ගණනය කිරීමේදී සම්පූර්ණ කළ සේවා වර්ෂ ගණන සඳහා සමාලෝචිත මූල්‍ය වර්ෂයේ දෙසැම්බර් මස වැටුපෙන් මාස භාගයක වැටුප පදනම් කර ගෙන තිබුණි.

(එ) ව්‍යාපෘති සේවකයින් විසින් සිදුකරන ලද වියදම් නැවත ගෙවීම සඳහා වැටුප් පාලන ගිණුමට මාරුකරන ලද රු. 805,450 ක මුදලක් අදාල වියදම් ගිණුම් වෙත මාරු නොකර පාලන ගිණුමේ තබා තිබුණි. අදාල පාලන ගිණුමේ ශේෂය මුදල් හා මුදල් සමාන දෑවලට ඇතුළත් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වැඩියෙන්ද කාර්යමණ්ඩල වියදම එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශ

--------------

2.1 මතය ව්‍යාවනය

------------------

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන,2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය:

- විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි වූ අතර මාගේ පරීක්ෂාවෙන් පෙනෙන පරිදි නිසි ගිණුම් වාර්තා සමාගම විසින් තබා නොමැත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007අංක 07දරන සමාගම් පනතේ 151වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බව මා දරන්නා වූ මතය වේ.